# 14 දේව රාජ්‍යයේ වටිනාකම්

ශු. ලූක් 19:1-10 / ශු. ජොහාන් 8:1-11


> මනුෂ්‍ය වර්ගයාට පාපයෙන් මිදීම ලබා දීම උදෙසා ජේසුස් වහන්සේ මෙලොවට වැඩිය බව අපි දනිමු. ඒ සඳහා දේව රාජ්‍යයේ වටිනාකම් අප වෙත හඳුන්වා දෙමින් ද ඒ තුළ පව්කරුවා නොව පාපය ප්‍රතික්ෂේප කරමින් ද ජේසුස් වහන්සේ අප වෙත ගෙන එන අභියෝගය "සාකෙවුස්" හා "පව්කාරියට ගල් ගැසීම" පිළිබඳ සිද්ධි ඇසුරින් විමසා බලමු.

1. ගැලවීමේ හඬැ'සෙයි - ගී නගව් ගී නගව්
   ජේසුස් පව්කරුන් මුදයි - ගී නගව් ගී නගව්
   ගැලවීමේ පුවත - අණ ලෙස දුන් හිමි
   රැගෙන යව් සත් වෙත - ගී නගව් ගී නගව්

2. පතුරව් රටින් රට - ගී නගව් ගී නගව්
   මිදීම පව්ටුන්ට - ගී නගව් ගී නගව්
   නද දෙව් කොදෙව් සැම - මුහුදුත් එක් ව ගයව්
   ගලවයි ජේසුස් තුම - ගී නගව් ගී නගව්

ඉහත ගීතිකාව ගායනා කරන විට අපට නිතැතින් ම සිහිපත් වන්නේ ජේසුස් වහන්සේ මෙලොව ගත කළ කාලයේ දී පව්කරුවන්ගේ ගැලවීම උදෙසා කැප වූ ආකාරය යි. එමෙන් ම අපහට ද ලැබෙන දෙවියන් වහන්සේගේ කරුණාව පිළිබඳ ව යි.

අපි බොහෝ විට විවිධ වූ හේතූන් නිසා පීඩා විඳිනා අය වෙමු.



මෙවන් හේතු නිසා පීඩා විඳින අපි එම පීඩාවලට අපේ ම ශක්තියෙන් විසඳුමක් සොයා වෙහෙස වන්නෙමු. නමුත් ජේසුස් වහන්සේ වදාළේ;

*"වෙහෙසෙන්නා වූ බර උසුලන්නා වූ සියල්ලෙනි, මා වෙත එන්න. මම ඔබට සහනය දෙන්නෙමි"යි යනුවෙනි.*

**ජේසුස් වහන්සේ අපගේ සහනදායකයාණෝ ය.**

එලෙස ජේසුස් වහන්සේගෙන් සහනය ලද දෙදෙනකු පිළිබඳ ව අපි විමසා බලමු.

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
**ශු. ලූක් 19:1-10**

ජේසුස් වහන්සේ ජෙරිකෝව මැදින් ගමන් කරන කල, රෝම අධිරාජ්‍යයාට සේවය කළ බදු අයකරන්නන්ගේ ප්‍රධානියකු වූ ධනවත් සාකෙවුස් නම් මනුෂ්‍යයකු උන්වහන්සේ දැක ගන්නා පිණිස ඔහු මිටි පුද්ගලයෙකු වූ බැවින් අත්තික්කා ගසක නැග සිටිනු දැක, ඒ ස්ථානයට පැමිණ,

ජේසුස් වහන්සේ : සාකෙවුස්, වහා ම බිමට බසින්න, අද මට ඔබේ ගෙදර නවාතැන් ගන්න ඕනෑ ය.

ජේසුස් වහන්සේ සාකෙවුස්ගේ නම කියා ආමන්ත්‍රණය කිරීම මෙහි දී ඉතා වැදගත් ය. උන්වහන්සේ අප නමින් ම හඳුනා ගැනීම පිළිබඳ ව දැනෙන ගෞරවය එද සාකෙවුස්ට ද දැනෙන්නට ඇත. තව ද ඔහුගේ ගෙදර නවාතැන් ගැනීමට උන්වහන්සේ පැමිණෙන බව ප්‍රකාශ කිරීම මගින් ජේසුස් වහන්සේ තමා පිළිගැනීමට ලක් කළ බව හැඟීමෙන් ඔහු තවත් සතුටට පත් වන්නට ඇත.

ජනතාව : උන්වහන්සේ පව්කාර මනුෂ්‍යයකු සමග නවාතැන් ගන්නට ගිය සේක." කියමින් කොඳුලෝ ය.

ජේසුස් වහන්සේ සාකෙවුස්ගේ නිවසට පැමිණීම පිළිබඳ ව සමූහයාගේ ප්‍රතිචාරය යහපත් නොවී ය. ඒ පිළිබඳ ව ජේසුස් වහන්සේ සමග සෘජු ව කතා කිරීමට ශක්තියක් නොවූයෙන් ඔවුහු එකිනෙකා ඒ පිළිබඳ ව කොඳුළෝ ය.

සාකෙවුස් ජුදෙව් සමාජයේ පිළිගැනීමට ලක් නොවූ මිනිසෙකු විය. ඒ, අයකැමියන් අසාධාරණ ලෙස බදු අය කරමින් ජනතාව දැඩි ලෙස පීඩාවට පත් කළ පිරිසක් වූ හෙයිනි. එකල ජුදෙව් සමාජයේ පිළිගැනීමට ලක් වූ පිරිස අතර රජවරුන්, පූජකවරුන්, පරිසිවරුන්, විනයධරයන් මෙන් ම ධනවත්තු ද වූහ. එමෙන් ම පව්කරුවන් ලෙස සලකමින් නොපිළිගැනීමට ලක් වූ අය අතර එඬේරු, දිලින්දෝ, අයකැමියෝ හා අන්‍ය ජාතීහු ද වූහ.

සාකෙවුස් එකල සමාජය තුළ මෙම දෙපිරිස ම නියෝජනය කළ තැනැත්තෙකු විය. ඔහු එක අතකින් ධනවතෙකි. එහෙත් ඔහු රෝම අධිරාජ්‍යයට සේවය කරමින් අසාධාරණ ලෙස ජනතාව පීඩනයට ලක් කරමින්, බදු අය කළ හෙයින් ජුදෙව් සමාජයේ ප්‍රතික්ෂේපයට ලක් වූවෙකි. එවන් පව්කරුවන් ජේසුස් වහන්සේ විසින් පිළිගෙන ක්‍රියා කිරීම සමූහයාගේ විරෝධයට හේතු වන්නක් විය.

සාකෙවුස්ගේ නිවසට ජේසුස් වහන්සේගේ පැමිණීම කරණ කොට ගෙන ඔහුගේ ජීවිතය මහත් වෙනසකට භාජනය විය.

සාකෙවුස් : "ස්වාමීනී මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි. යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම් ඔහුට සතර ගුණයක් ආපසු දෙමි."

සාකෙවුස්ගේ මෙම ප්‍රතිචාරයෙන් පැහැදිලි වන්නේ ජේසුස් වහන්සේ වැඩියේ ඔහුගේ නිවසට පමණක් නොවන බවයි. උන්වහන්සේ සාකෙවුස්ගේ ජීවිතය තුළට ද වැඩිය බවයි.

ජේසුස් වහන්සේ සාකෙවුස්ගේ නිවසට පැමිණ කිසිත් ප්‍රකාශ නොකළ නමුදු සාකෙවුස් ජේසුස් වහන්සේ ඉදිරියේ දැක්වූ ප්‍රතිචාරයෙන් මේ බව පසක් වේ. සාකෙවුස්ගේ හෘද සාක්ෂිය ඔහුට කතා කළේ ය. තමා කළ බරපතළ වැරදි ඔහුට අවබෝධ විය. ජේසුස් වහන්සේ සාකෙවුස් පිළිගෙන ඔහුගේ නිවසට පැමිණීම නිසා ඔහුගේ සිතුම් පැතුම් වෙනස් විය. ජීවිත පරිවර්තනයක් ඇති විය. සාකෙවුස් අලුත් පුද්ගලයෙකු බවට පත් විය.

ජේසුස් වහන්සේ : "ගැලවීම අද මේ ගෙදරට පැමිණ ඇත."

ජේසුස් වහන්සේ දකින්නට, උන්වහන්සේට ළංවන්නට සාකෙවුස් කැමති විය. සෙනග අතර උන්වහන්සේ දැකීමට ඇති අභියෝගය ඔහු ජය ගත්තේ ගසකට නැගීමෙනි. කවුරුන් හෝ උන්වහන්සේට ළංවෙන්නට කැමති වූ කල ජේසුස් වහන්සේ නිතැතින් ම අප වෙත ළංවන බව සනාථ කරමින් උන්වහන්සේ ගස මුලට පැමිණි සේක. සාකෙවුස් නමින් ම ඇමතූ සේක. ඔහුගේ ගෙදරට පිවිසුණු සේක. ඔහු වෙතට ජේසුස් වහන්සේ පිවිසීමේ ප්‍රතිඵලය වූයේ සාකෙවුස් මනස්ථාපනය වී තම ජීවිතය නිවැරදි කර ගැනිමයි. "අද මේ ගෙදරට ගැලවීම පැමිණ ඇත." යනුවෙන් ජේසුස් වහන්සේ පැවසූයේ එහෙයිනි. අප ද ජේසුස් වහන්සේ වෙතට පිවිසෙන්නට මනාප වූ කල, ඊට ඇති නොයෙකුත් බාධක මැඩගෙන යන්නට උත්සාහ කරන කල උන්වහන්සේ නිතැතින් ම අප වෙත පිවිසෙන සේක. එවිට සිදු වන්නේ අපගේ ජීවිත වෙනස් කර ගැනීමට පෙලඹීම යි. අපගේ ජීවිත නිවැරැදි කර ගැනීමට පෙලඹීම යි. ඒ අප අරබයා ස්වාමීන් වහන්සේගේ ඒකායන බලාපොරොත්තුව යි.

ජේසුස් වහන්සේ :"මොහුත් ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි. මනුෂ්‍ය පුත්‍රයාණෝ නැතිවූ දේ සොයන්නට ද ගලවා ගන්නට ද වැඩම කළ සේක.

ජේසුස් වහන්සේ සාකෙවුස් පිළිබඳ පැවසූ වදන් එලෙස විය.
ජුදෙව් ජනතාවගේ අදහස වූයේ "තෝරා ගත් සෙනග" තමන් බවත්, ආබ්‍රහම්ගේ පෙළපතට උරුමකම් කීම හා එනිසා ඔවුන්ට දෙවියන් වහන්සේගේ ගැලවීම නිතැතින් ම හිමි වන බවත් ය.

නමුත් ජේසුස් වහන්සේ යුදෙව්වරුන්ට පවසන්නේ ඔවුන්ගේ ම ජනතාව දෙවියන් වහන්සේ කෙරෙන් ඈත් වී සිටින ස්වභාවය පිළිබඳ ව ය. ජේසුස් වහන්සේ මෙලොවට වැඩියේ දෙවියන් වහන්සේ කෙරෙන් ඈත් වී පාපයට යොමු වූ ජනතාව නැවත දෙවියන් වහන්සේ වෙත ළඟා කරවීමට ය. පව්කරුවන් ලෙස සමාජයෙන් කොන් කර සිටින්නන් නිවැරැදි කර සමාජයට යළි පිළිගැනීමට ය. එමගින් සමාජයට යහපත් මෙහෙවරක් ඉටු කරවීමට ය.

එදා සාකෙවුස් ජේසුස් වහන්සේ දැක ගන්නට ආශාවක් දැක්වූවා සේ අද අප අතර ද ජේසුස් වහන්සේ හඳුනා ගැනීමට හා පිළිගැනීමට කැමති අය සිටිය හැකි ය. එමෙන් ම තමන්ගේ වැරැදි පිළිබඳ ව මනස්තාපනය වන අය ද සිටිය හැකි ය. එවන් අයහට ජේසුස් වහන්සේගේ වචනය ප්‍රකාශ කිරීමත්, උන්වහන්සේ කෙරෙහි අදහා ගැනි මෙන් ඇති කර ගත හැකි ජීවිත වෙනස හා ලද හැකි සහනය පිළිබඳ ව අත් දකින්නට සැලැස්වීමත් කිතුනු අපගේ වගකීම වේ.

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
**ශු. ජොහාන් 8:1-11**

**පව්කාර වූ මට//**
**ඇත්තේ ඔබ පමණක් ය**
**පව්කාර වූ මට**

අපගේ පාපයට කමාව ලැබීමට ඇති එක ම මාර්ගය ජේසුස් වහන්සේ පමණක් ම ය. ඒ බව මෙම කෙටි සංගීතයෙන් අපට පෙන්වා දෙයි. බොහෝ විට අපි අපගේ පාපයන් හඳුනා නොගෙන සිටින්නෙමු. නමුත් අන් අයගේ වරද පෙන්වා දීමට යුහුසුළු වන්නෙමු. එද පව්කාර ස්ත්‍රියට ගල් ගැසීමට උත්සාහ ගැනීමේ සිද්ධියේ දී ඇය ජේසුස් වහන්සේගෙන් ලද කරුණාවත් එමගින් අපගේ ජීවිතවලට ගෙන එනු ලබන පණිවුඩය පිළිබඳවත් විමසා බලමු.

දිනක් අලුයම උන්වහන්සේ දේව මාලිගාවට වැඩිය සේක. එහි සිටි මුළු සෙනඟ උන්වහන්සේ වෙත පැමිණියහ. උන්වහන්සේ වැඩහිඳ ඔවුන්ට උගන්වා වදාළ සේක. එවිට විනයධරයන් හා පරිසිවරු

> **ගුරු දේවයිනි, මේ ස්ත්‍රිය කාමමිථ්‍යාචාරයේ යෙදී සිටිය දී ම අල්ලා ගන්නා ලද්දී ය. මෙබඳු අය ගල් ගසා මරන්නට මෝසෙස් විසින් ව්‍යවස්ථාවෙහි අපට අණ කර ඇත. එහෙත් මැය ගැන ඔබ කියන්නේ කිමෙක් ද?**

මෙලෙස උන්වහන්සේගෙන් දිගින් දිගට ප්‍රශ්න කරද්දී;

ජේසුස් වහන්සේ : **"ඔබ අතරින් පවක් නැති තැනැත්තා පළමු කොට ඇට ගලක් ගසන්න."**

ඒ ඇසූ සෙනඟ අතරින් එකිනෙකා එතැනින් ඉවත් ව යන්නට ගියේ ය. අවසානයේ ඉතිරි වූයේ ඒ ස්ත්‍රිය හා ජේසුස් වහන්සේ පමණි.

ජේසුස් වහන්සේ : ස්ත්‍රිය ඔවුන් කොහේ ද? කිසිවකු ඔබට වරද තැබුවේ නැද්ද? මමත් ඔබට වරද නොතබමි. යන්න මින් පසු තවත් පව් නොකරන්න.

ජේසුස් වහන්සේ පරීක්ෂා කිරීමට හා උන්වහන්සේ පිට වරද තැබීමට ඔවුන් ඇය ගෙන එනු ලැබ, ඇයට එරෙහි ව චෝදනා එල්ල කරනු ලැබුවත්, ජේසුස් වහන්සේ ඇය ප්‍රතික්ෂේප නොකළ සේක. ඇයගේ පාපය පමණක් ප්‍රතික්ෂේප කළ සේක. එනිසා "තවත් පව් නොකරන්න" යැයි පැවසූ සේක. උන්වහන්සේ එම අවස්ථාවේ දී අවධාරණය කළේ අන් අයට වරද තැබීමට පෙර අප විසින් අප එකිනෙකා තුළ ඇති පාපයන් අවබෝධ කර ගත යුතු බව යි. අප පව්කාරයන් ව සිටිය දී අන් අයට ඇඟිල්ල දිගු නොකළ යුතු බව යි.

මේ අනුව ජේසුස් වහන්සේගේ කරුණාව තුළ සාකෙවුස් හා පව්කාර ස්ත්‍රිය පාපයෙන් මිදීම ලැබුවා සේ අප ද අප එකිනෙකාගේ ජීවිත තුළ ඇති පාපයන් හඳුනාගෙන ඒවා නිවැරැදි කරගෙන ස්වාමීන් වහන්සේගේ කරුණාවට ලක්වීම අවශ්‍ය වේ.

අප විසින් පව්කරුවන් ප්‍රතික්ෂේප නොකරමින් නමුත් පාපය පමණක් ප්‍රතික්ෂේප කිරීමට යොමු වෙමු. පාපිෂ්ට ජීවිත ගත කරනවා යැ'යි සිතන්නා වූ, සමාජයෙන් කොන් වූ, පිළිගැනීමට ලක් නොවූ අය හඳුනා ගෙන ඔවුන් වෙත ගොස්;

- ★ සැම දෙනා ම එක ලෙස ආදරයෙන් පිළිගනිමු
- ★ ස්වාමීන් වහන්සේගේ ගැලවීමේ පණිවුඩය ඔවුන් සමග බෙද ගනිමු
- ★ ජේසුස් වහන්සේ පිළිගැනීමට ඔවුන් සූදානම් කරමු
- ★ පාපය පමණක් ප්‍රතික්ෂේප කොට එහෙත් පව්කරුවන් පිළිගෙන ඔවුනට නිවැරැදි මඟ පෙන්වා ඔවුන් සමාජයේ අන් අයගේ ද සැලකිල්ලට හා පිළිගැනීමට ලක් කරමු
- ★ දේව රාජ්‍යයේ වටිනාකම් හඳුනා ගනිමින් ඒ අනුව ක්‍රියා කරමු.

**ක්‍රියාකාරකම**

1. ජේසුස් වහන්සේගේ ආදරයට, පිළිගැනීමට හා මඟ පෙන්වීමට ලක් වූ තවත් පුද්ගලයන් 5දෙනෙක් නම් කරන්න.
2. ඔබගේ දේවස්ථානයට අයත්, නමුත් මේ වන විට දේවස්ථානයට නොපැමිණෙන පිරිස දේව සභාවට කැඳවා ගැනීමට ඔබට ක්‍රියා කළ හැකි ආකාර 2ක් විස්තර කරන්න.